# පරිසර අමාත්‍යාංශය

# ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

## ලංසු කැඳවීම

## පවිත්‍රතා සේවා සැපයීම හා ආපනශාලා ගොඩනැඟිලි බදුදීම - 2026 / 2027

01. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් පහත සඳහන් ආයතන තුල පවිත්‍රතා සේවා පවත්වාගෙන යාම හා ආපනශාලා ගොඩනැඟිලි බදුදීම යන සේවාවන් සඳහා ව්‍යාපාර ලෙස ලියාපදිංචි වී ඇති ආයතන වලින් මුද්‍රා තබන ලද ලංසුපත් භාරගනු ලැබේ.

| ආයතනය | ලංසු ආරක්ෂණය | ලංසු ලියවිලි වටිනාකම රු. | ඇස්තමේන්තු වටිනාකම රු. (වැට් රහිත) |
|---|---|---|---|
| | මුදලින් හෝ බැංකු ඇපකරයක් ලෙස රු. | (ආපසු නොගෙවන) | |
| ගම්පහ උද්භිද උද්‍යානයේ වැසිකිළි පවිත්‍රතා සේවාව සැපයීම 2026-2027 (DNBG/ACC/F15/2026/2027-21) | 40,000.00 | 2,000.00 | 4,000,000.00 වාර්ෂික |
| සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානයේ ආපනශාලාව බදුදීම 2026-2027 (DNBG/ACC-F06/Procu/BUILDING/2026-13) | 15,000.00 | 1,000.00 | 100,000.00 මාසිකව |

02. ඉහත සේවාවන් සඳහා ඉල්ලුම්කරන ආයතන අදාළ සේවාවන් සඳහා වලංගු ලියාපදිංචියක් සහිත පිළිගත් ආයතනයක් විය යුතුය.

03. ලංසු ආකෘති කොන්දේසි හා අනෙකුත් විස්තර පේරාදෙණිය, අංක 14 හි පිහිටි ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයෙන් 2025.11.24 වන දින සිට 2025.12.08 වන දින දක්වා කාර්යාල දිනයන්හි පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා ආපසු නොගෙවන **ලංසු ලියවිලි ගාස්තු** ගෙවා ලංසු ලියවිලි ලබා ගත හැකිය. ලංසු ලියකියවිලි ලබා ගැනීම සඳහා ව්‍යාපාර ලිපි ශිර්ෂයකින් කෙරෙන ලිඛිත ඉල්ලීමක් හා ව්‍යාපාරය ලියාපදිංචි කරන ලද සහතිකයේ පිටපතක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

04. ලංසු කොන්දේසි පිළිබඳව හොඳින් අධ්‍යනය කර නිසි පරිදි සම්පූර්ණ කරන ලද ආකෘති පිටපත් දෙකකින් යුක්තව (මුල් පිටපත හා අනු පිටපත) 2025.12.08 වන දින පෙ.ව.11.00 ට පෙර ලියාපදිංචි තැපෑලෙන් සභාපති,දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව,පේරාදෙණිය යන ලිපිනයට එවිය යුතුවේ. එසේ නැතිනම් ලංසුපත් අතින් ගෙනවිත් දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී නිල කාමරයේ තබා ඇති ලංසුපත් බහාලන පෙට්ටියට බහාලිය යුතුය. නියමිත වේලාවෙන් පසුව ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. ලංසුපත් බහා එවන කවර විවෘත කළ හැකි ස්ථාන සීල් තබා එවිය යුතු අතර, එම කවරයේ වම්පස ඉහල කෙලවරේ අදාල කොන්ත්‍රාත්තුවේ නම සඳහන් කල යුතුය. 2025.12.08 වන දින පෙ.ව.11.00 ට ලංසුපත් භාරගෙන අවසන්වූ වහාම ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරියේ එකි ලංසු විවෘත කරනු ලැබේ.

06. ලංසු ආරක්ෂණය ඉහත සඳහන් පරිදි ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ තැන්පත් කළ හැකි අතර එසේ නොමැති නම් ලංසුපත් සමඟ ඉහතින් දක්වා ඇති මූල්‍ය වටිනාකමකින් යුත් ලංසු ආරක්ෂණ බැඳුම්කරයක් රජයේ පිළිගත් වාණිජ බැංකුවක් මඟින් අධ්‍යක්ෂ ජනරාල් - ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව නමින් 2026.02.23 දින දක්වා වලංගු වන පරිදි ලබාගෙන ඉදිරිපත් කළ යුතුය. ලංසු සුරක්ෂණ ඉදිරිපත් කර නොමැති ලංසුපත් සලකා බැලීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.මේ සඳහා බැංකු මඟින් නිකුත් කරනචෙක්පත් හා බැංකු ගෙවීම් අණකර භාරගනු නොලැබේ.

07. ලංසුපත් පිළිබඳ තීරණ ගැනිමේ සම්පූර්ණ අයිතිය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය සතුවන අතර, මෙම නිවේදනයේ හෝ ලංසු ආකෘතීන්හි සඳහන් හෝ සඳහන් නොවන මෙම ප්‍රසම්පාදන කාර්යයට අදාල කිසියම් කාරණයක් පිළිබඳ තීරණයක් ලබාදීමේ බලය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වේ. මේ පිළිබඳ වැඩිමනක් විස්තර දුරකථන අංක 081-2388654 මඟින් ප්‍රධාන ගණකාධිකාරී අමතා ලබාගත හැකිය.

සභාපති.
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.
2025.11.24